**ඉඩම් මැනුම් සභාව - 2016**

**------------------------------**

ඉඩම් මැනුම් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම.

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 45 ඡේදය ප්‍රකාරව රු.45,854 ක ගිණුම්කරණ මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සේවක පාරිතෝෂික සම්බන්ධයෙන් සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර සේවක පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

එකතුව රු.547,944 ක්වූ යන්ත්‍ර, ලී බඩු, පරිගණක උපාංග හා කාර්යාල උපකරණවලට අදාල උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

#### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

-------------------

මූල්‍ය ප්‍රකාශන අනුව ජංගම වගකීම් යටතේ ඇතුළත් රු.8,820 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය වසර 03 ක් ගත වී ඇතත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත. | |
| (අ) 12(1) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස්කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරු හෝ සිතියම් පිටපත් මැනුම්පති වෙත දත්ත පාදකයක් පිහිටුවීම සඳහා තැන්පත් කලයුතු වුවත් ඒ අනුව ක්‍රියාකර කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 43(1) හා (2) වගන්තිය | සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු 1031ක් සිටියද, 2016 මාර්තු 30 දින අංක 1960/29 දරන ගැසට් පත්‍රයේ 943 දෙනෙකුගේ නම් පමණක් පලකර තිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

---

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.834,430 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.732,669 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.101,761 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.414,573 කින් වැඩි වුවද අනෙකුත් දීමනා රු.328,892 කින් ද තැපැල් හා සන්නිවේදන වියදම් රු.103,526 කින් හා අනෙකුත් වියදම් රු.114,665 කින් වැඩි වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කලද 2016 වර්ෂයේ දී එය රු.834,430 ක ඌනතාවයක් බවට පත් වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයේ දී රු.2,471,638 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේ දී රු.2,791,615 ක් වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1** **කාර්යසාධනය**

---

මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තුවන්නා වූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන්වලට එකඟවන ලෙස පුහුණුවක් හෝ අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බවටත් තහවුරු කිරීම 2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව සභාවේ අරමුණු වේ.

ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 136 ක් වුවද වර්ෂය තුල විසඳා තිබුණේ පැමිණිලි 91 ක් හෙවත් සියයට 67 ක ප්‍රමාණයක් පමණි.

(ආ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී වෘත්තීය සංවර්ධන වැඩසටහන් 06 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 03 ක් පමණි.

(ඇ) ස්වකීය නිළධාරීන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයිය යුතු වුවත් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඇ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස් කල යුතු වුවත් එම නියමය පරිදි ක්‍රියාකර නොතිබුණි.

(ඉ) වාර්ෂික බලපත්‍ර නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයකුම ඉඩම් මැනුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු බව දක්වා ඇතත්, වාර්ෂිකව බලපත්‍ර ලබා නොගෙන වෘත්තීය මිනින්දෝරු කටයුතුවල යෙදෙන පුද්ගලයින් හඳුනාගැනීමට හෝ එවැනි කටයුතු තහනම් කිරීමට සභාව විසින් නීති රීති හඳුන්වා දී නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

සභාවේ කටයුතු ආරම්භ කළ 2005 වර්ෂයෙන් පසුව මිනින්දෝරුවරයකු සභාවේ ලියාපදිංචි වීමේදී අයකරනු ලබන රු.3,500 ක් වූ ලියාපදිංචි ගාස්තුව හා 2010 වර්ෂයෙන් පසුව වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් මිනින්දෝරුවරයකුගෙන් අයකරනු ලබන රු.2,500 ක් වූ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ කාර්යාල ඉඩ පහසුකම් පුළුල් කිරීම සඳහා කාමර බෙදා වෙන් කිරීමට අදාල කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු. 138,582 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම කාර්යය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිපාටියෙන් බැහැරව කර තිබූ අතර ලංසු විවෘත කළ දිනය ලෙස 2016 අගෝස්තු 20 (සෙනසුරාදා) ලෙස ව්‍යාජ දිනයක් යොදා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------------

අයවැයගත ආදායම් වියදම් තථ්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් ශීර්ෂ 03 ක හා වැය විෂයයන් 07 ක සියයට 21 සිට සියයට 247 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර එම තනතුරට නිළධාරියකු බඳවා ගැනීමට කටයුතු කිරීමට 2012 ජුලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝගකර තිබුණද එම තනතුර පිරවීමට විගණන දිනය වූ 2017 මාර්තු 31 දක්වාම කටයුතුකර නොතිබුණි.

**5.3 සමාජ වගකීම් ඉටුකිරීම**

---------------------------

බලයලත් මිනින්දෝරුවරුන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු මහජනතාවට ලබාගැනීමට හැකිවන පරිදි ඒවායේ පිටපත් මැනුම් සභාවට එවිය යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ගිණුම්කරණය | නිසි පරිදි ලෙජර් ගිණුම් පවත්වාගෙන නොයෑම හේතුවෙන් ගිණුම්වල අවිනිශ්චිත ශේෂයක් පැවතීම. |
| (ආ) ප්‍රසම්පාදන පරිපාලනය | ප්‍රසම්පාදන කටයුතු වඩා විනිවිදභාවයකින් යුක්තව සිදු නොකිරීම. |
| (ඇ) ආදායම් පාලනය | ගාස්තු සංශෝධනය කර නොතිබීම. |